# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2426/27 - 2025 මාර්තු මස 04 වැනි අඟහරුවාදා - 2025.03.04

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මාගේ යොමු අංකය* : බීඩී/ඊඑල්එල්/එල්එන්ඩී/69ඊ/ ඒකිවියූඑස්එන්/05.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/23/2020/සීර්බී/66.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දක්වෙන ඉඩම ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර:*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 69ඊ කිතල්ඇල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පට්ටියකුඹුර ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන පිළියෙල කරන ලද, අංක 710431, කලාප අංක 04, පත්‍ර අංක 1 හා 2023.05.26 වැනි දින දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 1 වශයෙන් සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0455 ක් පමණ වන ''කිනලන්වත්ත'' නමැති ඉඩම් කැබැල්ල(කැබලි 01):

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කිනලන්වත්ත; හිමිකම් කියන අය: ප්‍රධාන විධායක නිලධාරි, නමුණුකුල වැවිලි සමාගම, අංක 310, හයිලෙවල් පාර,නාවින්න, මහරගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0455.

මායිම් :- *උතුරට* : න.මැ.මූ.පි. 11 හි කැබලි අංක 88; *නැගෙනහිරට*: න.මැ.මූ.පි. 11 හි කැබලි අංක 88; *දකුණට*: න.මැ.මූ.පි. 11 හි කැබලි අංක 88 සහ කැබලි අංක 2; *බටහිරට* : කැබලි අංක 2 සහ න.මැ.මූ.පි. 11 හි කැබලි අංක 88.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 මාර්තු මස 27 වැනි දින පූ.භා. 10.00 ට ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 මාර්තු මස 27 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඉන්දික ගයාන් පතිරණ,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

2025 පෙබරවාරි මස 11 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 03 - 0032